**හලාවත ප්‍රාදේශීය සභාව**

**පුත්තලම දිස්ත්‍රික්කය**

**---------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, 2014 මැයි 02 දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 10 දින සභාපතිවරයාට යවා ඇත.

## 1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදය දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට හලාවත ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුන්නේශ්වරම් විශ්‍රාම ශාලාවේ පෙර බදු ගැණුම්කරුගෙන් හිඟ බදු වශයෙන් අයවිය යුතු රු.181,347 ක්ද, සභාවට පරිත්‍යාග කර තිබූ පොදු ඉඩමේ වටිනාකම රු.1,020,000 ක්ද, පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.7,946,185 ක්ද මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරී තිබුණි.

(ආ) 2012 වර්ෂයේ මුද්දර ගාස්තු අධි වෙන්කිරීම රු.1,275,971 ක් සමාලෝචිත වර්ෂයේ වෙනත් ආදායම් ගිණුමට හර කිරීමෙන් ආදායම රු. 1,275,971 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) 2013 දෙසැම්බර් 31 දිනට විකුණා නොතිබූ අංක 42 – 9088 හා අංක 43– 3972 දරන ලොරි රථ දෙක රු. 1,232,000 කට විකුණූ සේ සළකා ගිණුම්ගත කිරීමෙන් ණයගැති වටිනාකම හා මූලධන ආදායම් වටිනාකම රු. 1,232,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී ඉඩදිය හැකි ගෙවීම්වලට අදාල එකතු කළ අගය මත බදු වටිනාකම වූ රු. 119,056 ක් ආදායම් ලෙස නොගැනීමෙන් එම වටිනාකමින් ආදායම අඩුවෙන් හා ආපසු ගෙවිය යුතු තැන්පතු වටිනාකම වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සැපයුම් හා උපකරණ වියදම් රු. 31,680 කින් වැඩියෙන් දක්වා තිබුණු අතර, ගිවිසුම්වලට නොඑළඹෙන ලද කර්මාන්ත වටිනාකම වු රු.1,201,210 ක් සඳහා ණයහිමි ප්‍රතිපාදන සැලසීමෙන් ණයහිමි වටිනාකම හා ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තු වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) මිලදී ගැනීමට කටයුතු නොකළ කැබ් රථයේ වටිනාකම වෙනුවෙන් රු. 8,000,000 ක ණය හිමි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් එම වටිනාකමින් ණය හිමියන් හා උපකරණ වැය වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

### 1.3.2 නොසැසඳු පාලන ගිණුම්

මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ගිණුම් විෂයයන් අටක ශේෂයන්හි වටිනාකම ඊට අදාල උපයෝගී ලේඛණ සමග නොසැසඳුන අතර, එම විෂයයන්හි නොසැසඳු වෙනසේ වටිනාකම රු.11,479,240 ක් විය.

### 1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

ණයගැති ශේෂය තුල ඇතුළත් රු.1,730,581 ක් වූ දිගු කාලීන ණය වටිනාකම අයවීම අවිනිශ්චිත බව නිරීක්ෂණය වූ අතර, ණයහිමි ශේෂය තුල ඇතුළත් වසර 05 ක් ඉක්මවා හිඟ හිටි රු.120,000 ක් වූ ණය හිමියන්ට හිමිකම් පෑම අවිනිශ්චිත බව නිරීක්ෂණය විය.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම්

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබූ ගිණුම් විෂයයන් 05කට අදාල වටිනාකම රු. 296,813,966 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරික්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වු ආදායම රු.15,345,092 ක්වු අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවු ආදායම රු.40,881,420 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයයන් | අයවැයගත | තථ්‍ය ලැබීම් | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 |
| (අ) | වරිපනම් හා බදු | 2,254 | 2,393 | 2,569 |
| (ආ) | බදු කුලී | 6,812 | 6,525 | 876 |
| (ඇ) | බලපත්‍ර ගාස්තු | 3,237 | 3,237 | - |
| (ඈ) | වෙනත් ආදායම් | 75,173 | 64,563 | 107,157 |

### 2.2.2 වරිපනම් බදු

සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු රැස් කිරීම යහපත් තත්ත්වයක පැවතියද, වර්ෂ අවසානයට වූ රු.2,357,400 ක හිඟ වරිපනම් බදු මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | | රු. |
|---|---|---|---|
| (i). | උසාවි දඩ | - | 8,310,387 |
| (ii). | මුද්දර ගාස්තු | - | 42,796,885 |

### 2.4 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් සිදු කෙරේ.

(අ) උපපත්‍රිකා පොත් 25 ක තොරතුරු උප පත්‍රිකා පොත් ලේඛණයෙහි දක්වා නොතිබුණු අතර, ඉන් පොත් 06 ක් උපකාර්යාලවලට හෝ උප පත්‍රිකා පොත් භාවිතා කරන කිසිදු නිලධාරියකු වෙත භාරදී නොතිබුණි. එම උප පත්‍රිකා පොත් භෞතිකව නොවූ අතර, ඒ පිළිබඳව විගණනයෙන් පෙන්වා දෙන තෙක්ම කළමනාකරණයේ අවධානයට ලක්වී නොතිබුණි.

(ආ) සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල් ගෙවීම ප්‍රමාද කිරීම හේතුවෙන් අධිභාර වශයෙන් සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු. 22,392 ක් ගෙවා තිබුණි.

### 2.5 අයවැය පාලනය

වැය විෂයයන් 06 කට අදාලව වෙන්කර තිබූ රු. 1,350,000 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබූ අතර, වැය විෂයයන් 07 කට අදාලව වෙන්කර තිබූ රු. 1,685,000 ක ප්‍රතිපාදනවලින් රු. 1,463,970 ක් ඉතිරි කර තිබුණි. එහි ප්‍රතිශතය මුළු ප්‍රතිපාදන වලින් සියයට 87 ක් විය.

**3.** **පද්ධති හා පාලන**

**---------------------**

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය
(ඉ) ණයගැති හා ණයහිමි පාලනය